ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022/08/15 |

පැමිණිලි පාර්ශවය : ආර්.එම්.ආර්. ප්‍රසන්න මහතා
අංක : 275/7, පළවන පටුමඟ,
පල්ලිමුල්ල, පානදුර,
කෙසෙල්වත්ත.

වගඋත්තර පාර්ශවය : 01. සිසිර පෙත්තන්ත්‍රි මහතා,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
කොළඹ දකුණ.

02. එච්.ඩී.එච්.යූ.ජයසේකර මහතා,
පොලිස් අධිකාරි,
කොළඹ දකුණ 01.

<u>පැමිණිලි අංකය : **HRC/1724/22**</u>

**පැමිණිල්ල :-**

පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, තමාට 2022.01.29 වන දින කොවිඩ් ආසාදනය වූ බවත්, ඒ බව උසස් නිලධාරීන්ට විධිමත් ආකාරයෙන් දැනුම් දුන් බවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ වලට අනුව කොවිඩ් ආසාදනය වූ රෝගියෙකුට දින 14 ක් නිරෝධායන නිවාඩු ලැබීමෙන් පසුව සේවයට වාර්තා කළ යුතු බවත්, ඒ අනුව තමා චක්‍රලේඛනයට අනුව කටයුතු කර ඇති බවත්ය. පැමිණිලිකරු තවදුරටත් දක්වා ඇත්තේ, තමා රාජකාරියේ සිටියදී LTTE මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුගේ ප්‍රහාරයකට ලක්වීම නිසා සැත්කමක් කර ඇති බවත්, එම සැත්කම නිසා තමාට කොවිඩ් එන්නත ලබා ගැනීමට වෛද්‍යවරුන් අනුමත කර නොමැති බවත් දක්වා ඇත. මේ සම්බන්ධයෙන් පළවන වගඋත්තරකාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, සිසිර පෙත්තතන්ත්‍රි මහතා විසින් නියෝජ්‍ය පොලිස්පති, කොළඹ වෙත 2022.02.14 වන දින ද්වේශ සහගත ලෙස අසත්‍ය කරුණු දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත් පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. සභාපති / தவிசாளர் } 011-2505451 ෆැක්ස් / தொலைநகல் } 011-2505541/ 74 ඊමේල් / மின்னஞ்சல் } sechrcsl@gmail.cc

2022.03.03 වන දින පැමිණිලිකරුගේ මවගේ අවුරුද්දේ පිංකමට සහභාගී වීම සඳහා අදාළ නිවාඩු ඉල්ලා සිටීමේදී දෙවන වගඋත්තරකරු විසින් නිවාඩු අනුමත කර නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැන්වීමෙන් පසු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් 1 වන වගඋත්තරකරුට පැමිණිලිකරු වෙත අවශ්‍ය නිවාඩු ලබාදෙන ලෙස උපදෙස් ලබා දී ඇති බවත්, එම උපදෙස් වලට අනුව 1 වන වගඋත්තරකාර සිසිර පෙත්තතන්ත්‍රි - කොළඹ දකුණ විසින් දින 02 ක නිවාඩුවක් ලබා දී ඇති බවත්, ඒ පිළිබඳ දැනගැනීමෙන් පසු නියෝජ්‍ය පොලිස්පතිවරයා එය දින 03ක් දක්වා දීර්ඝ කර ලබා දී ඇති බවත් සඳහන් කර ඇත. මෙම තත්වය තුළ පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, පළවන වගඋත්තරකරු තමා සම්බන්ධයෙන් ද්වේශ සහගතව කටයුතු කරන බවයි.

තවද 2022.04.29 වන දින අරලියගහ මන්දිරයේ එච් 1 ගේට්ටුව ඉදිරිපිට සහකාර පොලිස් අධිකාරී නවරත්න මහතා සමඟ පැමිණිලිකරු රාජකාරියේ යෙදී සිට ඇති බවත්, එම අවස්ථාවේදී 2 වන වගඋත්තරකාර පොලිස් අධිකාරී සමන් ජයසේකර මහතා උපදෙස් ලබාදෙමින් එච් 1 දොරටුව ඉදිරිපිට ඇති කූඩාරම් සහ අනෙකුත් ඉටිරෙදි ගලවා ඉවත් කරන ලෙසට දැනුම්දී දුන් බවත් දක්වා ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරි නවරත්න මහතා සහ පැමිණිලිකරු ඇතුළු නිලධාරීන් අදාළ කූඩාරම් ඉවත් කිරීමට උත්සහ කළ නමුත්, එම අවස්ථාවේදී මතු වූ විරෝධතාවයන්ගේ ස්වභාවයන්ට අනුව එම කූඩාරම් ගැලවීමට යාම තුළින් නිලධාරීන්ගේ ජීවිත වලට සහ රජයේ දේපළ වලට හානි සිදුවිය හැකි බැවින්, ඒ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැන්වීමෙන් අනතුරුව සාමය කඩ නොවන ලෙස කටයුතු කරන ලෙසට ඔහු විසින් උපදෙස් ලබා දුන් බවත් දක්වා ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකාර පොලිස් අධිකාරී ඒ.ඩී.එච්.යූ ජයසේකර විසින් 1 වන වගඋත්තරකාර සිසිර පෙත්තතන්ත්‍රි මහතා වාර්තා කර ඇත්තේ, පැමිණිලිකරු බියගුලු නිලධාරියෙකු බවත් ස්ථානාධිපති ධූරයට සුදුසු නොවන බැවින් ස්ථාන මාරුවක් සිදුකරන ලෙසත්ය.

ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, එම ස්ථානයේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියා සහකාර පොලිස් අධිකාරි නවරත්න මහතා බවත්, ඊට අදාළ සියළු වගකීම් ඔහු වෙත පැවරෙන බවත්, එසේ තිබියදී ද්වේශ සහගත ලෙස පැමිණිලිකරුට විරුද්ධව ඉහළ නිලධාරීන්ට වාර්තා ඉදිරිපත් කිරීම තුළින් තමාට අසාධාරණයක් සිදුවූ බවයි. මේ අනුව පැමිණිලිකරුට ස්ථාන මාරුවක් ලබාදී ඇති බවත්, එම ස්ථාන මාරුව තුළින් පැමිණිලිකරුගේ මූලික අයිවාසිකම් උල්ලංඝනය වී ඇති බව සඳහන් කර ඇත.

ඉහත ස්ථාන මාරුව සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනා කිරීමෙන් පසු අදාළ ස්ථාන මාරුව අවලංගු කළ බව ද දක්වා ඇත.

පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, පොලිස්පතිවරයාගේ D/HRM/ADM2397/2022 දරණ 2022.07.19 දිනැති නියෝග අනුව නැවත වරක් තමාව බම්බලපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති

තනතුරේ සිට සාමාන්‍ය රාජකාරී සඳහා පානදුර කොට්ඨාශය වෙත ස්ථාන මාරුකර ඇති බවයි. එසේම මෙම ස්ථාන මාරුව තුළින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව ද දක්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

- පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :

තමා කොළඹ දකුණ කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වශයෙන් කටයුතු කරන බවට දක්වා ඇති අතර, කොවිඩ් වසංගත තත්ත්වය මත එම කාලයේදී ලබාගත හැකි නිවාඩු ප්‍රමාණය පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන සහ පොලිස්පති චක්‍රලේඛන වල සඳහන් වන බවත්, ඒ පිළිබඳ නිලධාරින්ට දැනුම් දී ඇති බවත්, ඒ අනුව විශේෂ නිවාඩු දින 07 ක කාලයක් සහ එයින් ඔබ්බට ගන්නා නිවාඩු වැටුප් රහිත පුද්ගලික නිවාඩු ලෙස සැළකෙන බව ප්‍රකාශ කරන ලද අතර, කොවිඩ් වසංගතයට වැඩිපුරම මුහුණ දුන් කොට්ඨාශ භාර නිලධාරියා තමා බවත් දක්වා ඇත. එමනිසා බොරැල්ල පොලිස් ස්ථානය, නාරාහේන්පිට පොලිස් ස්ථානය, කිරුළපන පොලිස් ස්ථානය ඇතුළු පොලිස් ස්ථාන අටක් තම අධීක්ෂණය යටතේ පවතින බවත්, බොරැල්ල පොලිස් ස්ථානය වසා දැමීමට සිදුවූ බවත්, ඒ සඳහා අනුරාධපුර පොලිස් ස්ථානයෙන් නිලධාරින් ගෙන්වා එය පවත්වාගෙන ගිය බවත්, මෙම තත්වය තුළ මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලීසිය තුළ ස්ථානාධිපතිවරයා සිටිය යුතු බවත්, කොවිඩ් තත්වය මත විශාල රාජකාරියක් පොලීසියට පැවරී තිබූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව අදාළ චක්‍රලේඛන ප්‍රකාරව තමා විසින් කටයුතු කර ඇති බවද පැමිණිල්ලේ පළවන චෝදනාව සම්බන්ධයෙන් කරුණු දක්වමින් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ දෙවන චෝදනාව වන මවගේ දානමය පිංකමට නිවාඩු ලබා නොදීම වරදක් නොවන බවත්, නිවාඩු යනු හිමිකමක් නොව වරප්‍රසාදයක් බවට ආයතන සංග්‍රහයේ සඳහන්ව ඇති බවත්, නිවාඩු නිර්දේශ කරනු ලබන්නේ සහකාර පොලිස් අධිකාරීවරයා බවත්, සාමාන්‍ය ක්‍රමය වන්නේ උදාහරණයක් ලෙස පළවන වගඋත්තරකරු නිවාඩු යන්නේ නම් කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරීන් තිදෙනාම සක්‍රියව සිටිය යුතු බවයි . එසේම ස්ථාන භාර නිලධාරියෙකු නිවාඩු යන්නේ නම් එම දිස්ත්‍රික්කයේ එක් අයකුට පමණක් නිවාඩු යාමට හැකි බවත්, ස්ථානාධිපතිට සහ සහකාර පොලිස් අධිකාරිට එක විට නිවාඩු යා නොහැකි බවත් ප්‍රකාශ කර සිටි .

පැමිණිලිකරු මවගේ පිංකම සම්බන්ධයෙන් නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් තමා වෙත කරුණු පැහැදිලි කළ පසු තමා විසින් දින 02 ක් නිර්දේශ කළ බවත්, තමා කරන නිර්දේශය අඩු හෝ වැඩි කිරීමට නියෝජ්‍ය පොලිස්පතිට බලය ඇති බවත්, ඒ අනුව තමා විසින් පැමිණිලිකරුගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් සිදුකර නොමැති බවත් සඳහන් කරයි.

තුන්වන චෝදනාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් 2022.04.29 වන දින අරගල භූමියේ රාජකාරී කිරීම සඳහා සහකාර පොලිස් අධිකාරීවරයෙක්, පොලිස් අධිකාරීවරයෙක් ඇතුළු නිලධාරීන් 50 දෙනෙක් යොදවා තිබූ අතර, එහි අධීක්ෂණ කටයුතු සඳහා සෑම දිනකම ස්ථානාධිපතිවරයෙක් යොදවා තිබූ බවත්, ස්ථානාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ තම උසස් නිලධාරීන් දෙන නියෝග සහ උපදෙස් අනුව කටයුතු කිරීම බවය. මෙම නියෝග පැහැර හැරීම සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරීවරයාගේ ගමන් සටහන් පොතේ පොලිස් ආඥා පනතේ 56 වන වගන්තියට අනුව සටහන් කර තිබූ බවත්, එසේම උසස් නිලධාරීන් දෙන ලද නියෝග පහළ නිලධාරීන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින බවත්, ඒ අනුව සහකාර පොලිස් අධිකාරී සමන් ජයසේකර මහතා විසින් පොලිස් නිලධාරියාගේ ගමන් සටහන් පොතේ යොදන ලද සටහන් තමන් වෙත යොමුකළ බවත්, ඒ අනුව 59/S1/OUT/1133/2022දරණ ලිපිය මඟින් තමා විසින් එදිනම නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කළ බවයි. එසේම පොලිස් අධිකාරීවරයාගේ වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත්තේ පැමිණිලිකරු "මම ඔය නීතිවිරෝධී නියෝග ක්‍රියාත්මක කරන්නේ නැහැ" යනුවෙන් සඳහන් කරන ලද බවත්, තමා විසින් සිදුකර ඇත්තේ චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කිරීම පමණක් බවට ප්‍රකාශ කර ඇත. මේ අනුව පැමිණිලිකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසන්න රත්නායක නිලධාරියාට පානදුර කොට්ඨාශයට ලබා දී ඇති ස්ථාන මාරුවීම පොලිස්පතිතුමාගේ නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ප්‍රකාරව සිදුකර ඇති බව ද දක්වා ඇත.

තවද, මෙම නිලධාරියා 2021.10.24 වන දින කොළඹ දකුණ කොට්ඨාශයට වාර්තා කිරීමෙන් අනතුරුව මොහුගේ දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් බම්බලපිටිය පොලිස් ස්ථානයට අනුයුක්තව ඔහු යටතේ සිටින නිලධාරීන් විසින් පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කර ඇති පෙත්සම් විමර්ශනය කිරීමට තමා වෙත එවා ඇති බව ද සඳහන් කරයි. එසේම එම නිර්ණාමික පෙත්සම්වල සඳහන් කරුණු වලට අදාළව කොළඹ දකුණ කොට්ඨාශයේ බුද්ධි ස්ථානාධිපති වෙතින් රහස්‍ය වාර්තාවක් කැඳවීමට ද ඊට අමතරව පොලිස් අධිකාරී දකුණ I මඟින් පෙත්සම්වලට අදාළව විමර්ශනයක් ද සිදුකර ඇති බව සඳහන් කරයි.

වගඋත්තරකරුගේ වාර්තාවේ තවදුරටත් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර ප්‍ර.පො.ප රත්නායක නිලධාරියාට එරෙහිව 1994 අංක 22 දරණ වධදීම හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැළකීමකට, දඬුවමකට හෝ එරෙහි වූ සම්මුති පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව හෝමාගම මහාධිකරණයේ HC 311/218 දරණ නඩුවක් විභාග වෙමින් පවතින බවත්, එය ආයතන සංග්‍රහයේ ii වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 27:10 වගන්තිය ප්‍රකාර සාපරාධී වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් හෝ රාජ්‍ය නිලධාරියෙකුට විරුද්ධව අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවකදී එම නිලධාරියා වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කළ යුතු බවට සඳහන් කර ඇත. ඒ අනුව මෙම නිලධාරියා වැඩ තහනමකට ලක්කළ යුතු නිලධාරියෙකු බවට සඳහන් කර ඇත.

- දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :

දෙවන වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරී සමන් ජයසේකර මහතා ප්‍රකාශ කර සිටින්නේ, තමා කොළඹ දකුණ කොට්ඨාශයේ දිස්ත්‍රික් 1 භාර නිලධාරියා ලෙස කටයුතු කරන බවත්, ඒ අනුව කොල්ලුපිටිය, බම්බලපිටිය පොලිස් ස්ථාන නිරීක්ෂණය කරන බවත්, කොල්ලුපිටිය පොලිස් වසමේ අරලියගහ මන්දිරය ප්‍රදේශයත් අධීක්ෂණ කටයුතු සිදුකරන ලද බවත්, අරලියගහ මන්දිරයේ අංක 1 ගේට්ටුව ඉදිරිපිට මයිනාගම නැමැති ස්ථානයේ කූඩාරමක් අටවාගෙන තිබූ බවත්, අරලිය ගහ මන්දිරයට විශේෂ ආරක්ෂාවක් සඳහා ට්‍රක් රථ ගාල් කර තිබූ බවත්, එම ස්ථානය ඉදිරිපිට රාජකාරී සඳහා සහකාර පොලිස් අධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සහ ස්ථානාධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙක් නිලධාරීන් 20, 25 අතර ප්‍රමාණයක් යොදවා තිබූ බවයි. 2022.04.30 වන දින උදෑසන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා තමාට කතාකොට අරලියගහ මන්දිරය ඉදිරිපිට ආරක්ෂාවට නවතා ඇති බස්වල ටෙන්ට් රෙදි ඇදලා තියනවා, වහාම ඒවා ඉවත් කරන ලෙසට දැනුම් දුන් බවත්, මෙදින එම ප්‍රදේශය භාරව සිටි බම්බලපිටිය ස්ථානාධිපති ප්‍රසන්න රත්නායක සහ ඊට අමතරව විශේෂ රාජකාරියට පැමිණි සහකාර පොලිස් අධිකාරී නවරත්න මහතා සහ තවත් නිලධාරීන් පිරිසක් රාජකාරියට කැඳවා තිබූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව තමා අධීක්ෂණය කරන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයෙකු වන ප්‍ර.පො.ප ප්‍රසන්න රත්නායකට දුරකථනයෙන් කතාකොට පොලිස් බස්වල එල්ලා තිබූ ටෙන්ට් රෙදි වහාම ඉවත් කරන ලෙසටත්, නැවත ඒවා ඉදි නොකිරීමට කටයුතු කරන ලෙසටත් උපදෙස් දුන් බවත්, එවිට තමාගේ නියෝග බම්බලපිටිය පොලිස් ස්ථානාධිපති විසින් ප්‍රතික්ෂේප කරන ලද බවත්, "මට ඕවා කරන්න බැහැ ඕන කෙනෙකුට කියලා කරගන්න, මම නීතිවිරෝධී දේවල් කරන්නේ නැහැ" යැයි ප්‍රකාශ කොට තම නියෝග පැහැර හැරීමක් සිදුකළ බවත්, තම අධීක්ෂණය යටතේ සිටින පොලිස් ස්ථානාධිපතිවරයෙක් මෙසේ ප්‍රකාශ කිරීම තුළින් තමා මවිතයකට පත්වූ බවත්, ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට දැනුම් දුන් බවත්, ඒ අනුව කොල්ලුපිටිය පොලිස් ස්ථානයේ උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ සටහන් යෙදූ බවත් සඳහන් කර ඇත.

එසේම, 2 වන වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමා විසින් ලබාදුන් නියෝගය බම්බලපිටිය ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව එම රාජකාරිය වෙනත් අයෙකුට පැවරීමට කටයුතු නොකල බවයි. එසේම ඒ අවස්ථාවේදී බම්බලපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන ස.පො.අ.නවරත්න මහතා එම ස්ථානයේ සිටි බව ද පිළිගෙන ඇත. එසේම එම රාජකාරිය ඊට පසු වෙනත් නිලධාරියෙක් ලවා ඉටු කරවා ගැනීමට කටයුතු නොකළ බවත්, අදාළ කූඩාරම් සහ ටෙන්ට් ඉවත් කරනු ලැබුවේ පසුව ගන්නා ලද අධිකරණ නියෝගයකින් පසුව බව ද පිළිගෙන ඇත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ලට අදාළ වගඋත්තරකරුවන් වෙත කරුණු තුනක් ඔස්සේ පැමිණිලිකරු විසින් චෝදනා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරුට කොවිඩ් ආසාධනය වීමෙන් පසුව ලබාදී ඇති නිවාඩු සම්බන්ධයෙන් පොලිස්පති විසින් නිකුත් කළ සී.ආර්.ටී.එම් 213 - ආර්.ටී.එම් 361 දරණ චක්‍රලේඛනයට අනුව දින 10 ක නිවාඩුවක් හිමිවිය යුතු අතර, එහි ආසාධිත නිලධාරියෙක් 11 වන දිනයේ රාජකාරි වාර්තා නොකරන්නේ නම් එම නිලධාරියා එයට හේතු සහිත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ හෝ රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු බවට දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව අදාළ චක්‍රලේඛනයට අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට නිවාඩු ලබා දීමක් සිදුකර නැති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සම්බන්ධයෙන් පළවන සහ දෙවන වගඋත්තරකරුවන් උසස් නිලධාරින් වෙත කරුණු වාර්තා කර ඇති අතර, එම වාර්තා වල සඳහන් කරුණු ඉහත චක්‍රලේඛනය අනුව නිවැරදි නොවන බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුට සාමාන්‍ය නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ක්‍රියාත්මක විය යුතු බවට නිරීක්ෂණය වන අතර, නිවාඩු යනු වරප්‍රසාදයක් මිස අයිතිවාසිකමක් නොවන බව ආයතන සංග්‍රහයේ දක්වා ඇත.

පැමිණිලිකරු ඔහුට ලබාදුන් නියෝග පැහැර හැරීම සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු විසින් නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ සටහන් යොදා ඇති බවත්, එම සටහන් වල පැමිණිලිකරු බියගුලු, ස්ථානාධිපතිවරයෙකුට සුදුසු නොවන පුද්ගලයෙක් බවට වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

2022.04.29 වන දින දෙවන වගඋත්තරකරු විසින් නියෝග ලබාදෙන අවස්ථාවේදී එම ස්ථානයේ සහකාර පොලිස් අධිකාරිවරයෙකු සිට ඇති බවත්, එම නිලධාරියා පැමිණිලිකාර නිලධාරියාට වඩා ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකු බවට නිරීක්ෂණය වේ.

එම ජ්‍යෝෂ්ඨ නිලධාරියා එම නියෝගය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ සටහන් යෙදූ බවට නිරීක්ෂණය නොවේ.

එසේම එම නිලධාරියාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් උසස් නිලධාරින්ට කිසිදු වාර්තාවක් පළවන සහ දෙවන වගඋත්තරකරු විසින් ඉදිරිපත් කිරීමක් සිදුකර ඇති බවට නිරීක්ෂණය නොවේ.

අරලිය ගහ මන්දිරය ඉදිරිපිට ඇති ටෙන්ට් රෙදි සහ අට්ටාල ගලවා ඉවත් කරන ලෙසට දෙවන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත නියෝග ලබාදී ඇති බව නිරීක්ෂණය වන අතර, පළවන වගඋත්තරකරුගේ එම නියෝගය දෙවන වගඋත්තරකරු විසින් එම ස්ථානයේ රාජකාරි කළ නිලධාරින්ට

ලබාදී ඇති අතර, ඒ අනුව එදින එම නියෝගය ක්‍රියාත්මක කිරීමට පැමිණිලිකරු ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, එම අවස්ථාවේදී උණුසුම්කාරි තත්ත්වයක් ඇති වී ඇති බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන වීඩියෝ පට මගින් නිරීක්ෂණය වේ.

සිද්ධිය වුන කාල වකවානුවේදී රටෙහි පැවති තත්ත්වය තුළ මෙවැනි විරෝධතා කූඩාරම් සහ අට්ටාල දිවයිනේ සෑම ප්‍රදේශයකම ඉදි කර තිබූ අතර, එම ඉදි කිරීම් ඉවත් කිරීම පොලිසිය විසින් සිදුකර නොමැති බවත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට පවරනු ලැබුවා යැයි කියන රාජකාරිය පසුදින හෝ වෙනත් නිලධාරියෙක් ලවා ක්‍රියාත්මක කළ බවට කරුණු නිරීක්ෂණය නොවේ.

අරලිය ගහ මන්දිරය ඉදිරිපිට තිබූ අට්ටාල සහ ඉටි රෙදි ආවරණ ඉවත් කර ඇත්තේ ඊට දින කිහිපයකට පසුව අධිකරණ නියෝගයක් ලබාගැනීමෙන් පසුව බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුට සේවා අවශ්‍යතාවය මත පළමු ස්ථාන මාරුව ලබාදී ඇති බවට සඳහන් වුවත්, වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම තුළ එම කරුණු තහවුරු කිරීමට වගඋත්තරකරුවන් විසින් කරුණු ඉදිරිපත් කිරීමක් සිදුවී නොමැති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පළමු ස්ථාන මාරුව සම්බන්ධයෙන් මහජන ආරක්ෂාව සහ සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනා කිරීමෙන් පසුව අදාළ ස්ථාන මාරුව අවලංගු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුට 2022.07.19 වන දින පොලිස්පතිවරයාගේ ආර්ටීඑම් 434 නියෝගය මත බම්බලපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති තනතුරේ සිට සාමාන්‍ය රාජකාරි සඳහා පානදුර කොට්ඨාශයට නැවත ස්ථාන මාරුවක් ලබාදී ඇති බවට නිරීක්ෂණය වේ.

අදාළ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකය මගින් පරීක්ෂණයක් සිදුකරනු ලබන බවත්, එම පරීක්ෂණයේ අවසන් වාර්තාව මේ වනතුරු නිකුත් කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරු කොවිඩ් ආසාධනය වීමෙන් පසු පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති අදාළ චක්‍රලේඛන ප්‍රකාරව කොවිඩ් රෝගියෙකුට හිමිවිය යුතු නිවාඩු පැමිණිලිකරු වෙත ලබානොදීම වගඋත්තරකරුවන් විසින් සිතාමතා හෝ නොසැලකිලිමත්භාවය මත සිදුකරන ලද ක්‍රියාවක් බවට නිගමනය කළ හැක.

එසේම, පැමිණිලිකරු ඉහළ නිලධාරින්ගේ නියෝග ක්‍රියාත්මක නොකිරීම මත ඔහුට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් සලකා බැලීමේදී අදාළ නියෝග ලබාදෙන අවස්ථාවේදී පැමිණිලිකරුට වඩා ඉහළ නිලධාරියෙක් එම ස්ථානයේ රාජකාරි භාරව කටයුතු කර ඇත. එවැනි අවස්ථාවක අදාළ නියෝගය ලබාදිය යුත්තේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට වන අතර, එම නියෝගය ක්‍රියාත්මක කරවීමේ වගකීම රඳා පවතිනුයේ ද එම ජ්‍යෙෂ්ඨ නිලධාරියා මතය. ඒ අනුව ඉහළ නිලධාරයාට පරිභාහිරව පහළ නිලධාරියෙකුට අණ දීම සාමාන්‍ය නිල බල ක්‍රමය අනුව ගලාගෙන ඒමේ පිළිගත් පිළිවෙතක් නොවන බවත්, එසේම රාජකාරි ස්ථානයේ පැමිණිලිකරු සමඟ සිටි ඉහළ නිලධාරියා මඟහැර පැමිණිලිකරුට පමණක් රාජකාරි පැහැර හැරීමේ චෝදනාව එල්ල කිරීම යුක්ති, යුක්ති සහගත නොවන බවට නිගමනය කළ හැක.

මේ සම්බන්ධයෙන් තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී පැමිණිලිකරුට අදාළ නියෝගය ලබාදුන්නේ යැයි සැලකුවද, රටේ පැවති අරගලකාරි තත්ත්වය යටතේ එම නියෝගය ක්‍රියාත්මක කිරීම ප්‍රයෝගිකව සිදුකිරීමට හැකියාවක් තිබුනේ ද යන්න සම්බන්ධයෙන් ගැටළු මතුවන අතර, වගඋත්තරකරුවන් විසින් ලබාදුන් නියෝගයට අදාළ රාජකාරිය එම අවස්ථාවේම සිදුකළ යුතුව තිබුනේ නම්, එය පැමිණිලිකරු විසින් සිදු නොකිරීමෙන් පසුව වෙනත් නිලධාරියෙකු ලවා සිදු නොකලේ මන්ද යන්න කොමිෂන් සභාව විසින් විමසීමේදී ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ට නිසි කරුණු ඉදිරිපත් කිරීමට නොහැකිවීම ගැටළු සහගත වේ.

ඉහත නිරීක්ෂණ වලට අනුව අරලිය ගහ මන්දිරය අසල තිබු කුඩාරම් සහ ඉටි රෙදි ඉවත් කිරීම සිදුකර ඇත්තේ අධිකරණයෙන් පසුව ලබාගන්නා ලද නියෝගයක් මත වන අතර, ඒ අනුව නිගමනය වන්නේ වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට ලබාදී ඇති නියෝගය ඒ අවස්ථාවේදී ඉටු කිරීමට පැමිණිලිකරුට හැකියාවක් තිබී නොමැති බවයි.

ඒ අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් රාජකාරියේ සිටියදී පහළ නිලධාරියෙකුට එම රාජකාරිය සිදුකිරීම සඳහා නියෝග ලබාදී එම නියෝගය ක්‍රියාත්මක නොකළ බවට පහළ නිලධාරියාට විරුද්ධව ඉහළ නිලධාරින්ට වාර්තා කිරීම තුළින් සහ එම වාර්තා පදනම් කරගෙන පැමිණිලිකරුව ස්ථාන මාරු කිරීම තුළින් පැමිණිලිකරුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකරුට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, සේවා අවශ්‍යතාවය මත යැයි සඳහන් කරමින් පැමිණිලිකරුට ලබාදී ඇති ස්ථාන මාරුව

වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර, පැමිණිලිකරුව පෙර රාජකාරි කරන ලද පොලිස් ස්ථානයෙහි ස්ථානාධිපති තනතුරේ නැවත පිහිටුවා රාජකාරි කිරීමට අවස්ථාව ලබාදීම උචිත බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශයක් නිකුත් කරන ලෙසට පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.08.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරලු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
177, නාවල පාර,
නාරාහේන්පිට.

} ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

B/R